

බුද්ධශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

புத்தசாசனம்,கலாசாரம் மற்றும் மத அலுவல்கள் அமைச்சு

Ministry of Buddhasasana, Cultural and Religious Affairs

වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශය

ஆண்டறிக்கையும் நிதிசார் கூற்றுக்களும்

Annual Report and Financial Statements

2021



ටවර් හෝල් රඟහල පදනම

டவர் மண்டப அரங்க மன்றம்

Tower Hall Theatre Foundation

බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

புத்தசாசனம் கலாசாரம் மற்றும் மத அலுவல்கள் அமைச்சு

Ministry of Buddhasasana, Cultural and Religious Affairs

වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශය

ஆண்டறிக்கையும் நிதிசார் கூற்றுக்களும்

Annual Report and Financial Statements

2021

ටවර් හෝල් රඟහල පදනම

டவர் மண்டப அரங்க மன்றம்

Tower Hall Theatre Foundation

පටුන

පිටු අංකය

1.	දැක්ම, මෙහෙවර, අරමුණ , පරමාර්ථ	1
2.	හැඳින්වීම	2
3.	ටවර් හෝල් රඟහල පදනම භාරකාර මණ්ඩලය	3
4.	ටවර් හෝල් රඟහල පදනම සංවිධාන ව්‍යුහය	4
5.	පාලන හා සංවර්ධන අංශය	5
6.	a. ටවර් හෝල් රඟහල පදනම ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිළධාරීන්	9
	b. අනුමත කාර්ය මණ්ඩලය සහ 2021.12.31 දිනට කාර්ය මණ්ඩලය	10
	c. ඉල්ලා අස්වීම්,කොන්ත්‍රාත් කාලය අවසන් වීම්,බඳවා ගැනීම්	11
	d. පුහුණු පාඨමාලා සහභාගී වූ කාර්ය මණ්ඩලය	11
	e.රංග ශාලා නවීකරණය සහ සංවර්ධනය	11
	f.රංග ශාලා හා ශබ්දාගාර වෙන් කිරීම්	11
7.	නාට්‍ය ප්‍රවර්ධන අධ්‍යාපන හා වැඩසටහන් අංශය	13
	2021 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්	15-22
8	මුදල් අංශය	23
	a. විගණකාධිපති වාර්තාව	25-36
	b. අවසන් මූල්‍ය ප්‍රකාශය	37-61
9.	ස්තූතිය	63

ටවර් හෝල් රඟහල පදනම

දැක්ම

"ශ්‍රී ලංකාවේ ජාතික නාට්‍ය මධ්‍යස්ථානය බවට පත්වෙමින් ගුණාත්මක නාට්‍ය හා රංග කලා සංස්කෘතියක් බිහිකිරීමෙහිලා පුරෝගාමී ආයතනය බවට පත්වීම"

මෙහෙවර

ශ්‍රී ලංකාව තුළ ගුණාත්මක නාට්‍ය හා රංග කලා සංස්කෘතියක් බිහිකිරීමට සහ ප්‍රවර්ධනයට දායක වෙමින් ඒ සඳහා අවශ්‍ය දැනුම යටිතල පහසුකම් සපයමින් නූතන විශ්ව නාට්‍ය හා රංගකලා භාවිතයේ නව අත්දැකීම් තාක්ෂණය සහ ඥානය නොඅඩුව ලබා ගැනීමට අවශ්‍ය නව මංපෙත් සකසා දෙමින් නාට්‍ය හා රංගකලා නිර්මාණවේදීන් දිරිගන්වමින් රටේ සංවර්ධනයට මෙන්ම මානව වර්ගයාගේ යහපත සඳහා නිර්මාණකරණයේ යෙදීමට ඔවුන් පෙළඹවීම.

අරමුණු හා පරමාර්ථ

(අ) ජාතික නෘත්‍ය කටයුතු දිරිගැන්වීම සහ ප්‍රවර්ධනය කිරීම.

(ආ) රඟහල පිළිබඳ දැනුම අවබෝධය සහ එහි භාවිතය වර්ධනය කිරීම හා දියුණු කිරීම.

(ඇ) ප්‍රාසාංගික නාට්‍ය කලාකරුවන්ට හා ශිල්පීන්ට මුදලින් උපකාර කිරීම හා නාට්‍ය කලාකරුවන් පුහුණු කිරීමෙහිලා සහය වීම.

(ඈ) ඔපෙරා ,ගීත නාට්‍ය, නැටුම් නාට්‍ය හා සංගීතය නිෂ්පාදනය කිරීමේ, ඒ පිළිබඳ පරීක්ෂණ කිරීමේ සහ

ඒවා රඟදැක්වීමේ නියුතු වීම. හා ඒ පිළිබඳ අධ්‍යාපනය ලබා දීම.

(ඉ) පක්ෂග්‍රාහී දේශපාලනමය කාර්යයන් සඳහා රඟහල ප්‍රයෝජනයට නොගතයුතුවන ලෙස ඉහත දක්වා ඇති පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහාද සුදුසුයැයි මණ්ඩලය සලකන වෙනත් කාර්යයන් සඳහා ද ටවර් හෝල් රඟහල ජාතික සිහිවටනයක් ලෙස ප්‍රතිෂ්ඨාපනය කිරීම,ආරක්ෂා කිරීම,පවත්වාගෙන යාම සහ ප්‍රයෝජනයට ගැනීම.

හැදින්වීම

ජාතික නෘත්‍ය කටයුතු දිරිගැන්වීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා ටවර් හෝල් රඟහල ජාතික රඟහලක් ලෙස ප්‍රයෝජනයට ගැනීම මුඛ්‍ය පරමාර්ථය කොට නාට්‍ය හා රංග කලාව වෙනුවෙන් ස්ථාපිත අනෙකුත් අරමුණු හා පරමාර්ථයන් පෙරදැරි කර ගෙන 1978 අංක 01 දරණ පාර්ලිමේන්තු පනතින් ස්ථාපිත කරන ලද ටවර් හෝල් රඟහල පදනම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු අග්‍රාමාත්‍යතුමාගේ සභාපතීත්වයෙන් හා එතුමන් ඇතුළු නිලබලයෙන් පත්වන සාමාජිකයන් දස දෙනෙකුගෙන් සහ ගරු අග්‍රාමාත්‍යතුමන් විසින් තුන් අවුරුදු කාලයක් සඳහා පත්කරනු ලබන සාමාජිකයින් පස් දෙනෙකුගෙන් සමන්විත භාරකාර මණ්ඩලයක් මඟින් පරිපාලනය වේ.

ටවර් හෝල් රඟහල පදනම තම අරමුණු හා පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම උදෙසා සුවිශාල කාර්යභාරයක් ජාතික උරුම ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පි ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමන් හා එම අමාත්‍යාංශයේ ලේකම්තුමියගේ උපදේශකත්වය හා අධීක්ෂණය මත ක්‍රියාත්මක කරන ලදී.ඒ අනුව 2021 වසරේ කොවිඩ් වසංගත තත්වය පැවතියද එම වර්ෂය පුරාවට වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කරන ලදී.ඒ අනුව ටවර් හෝල් ශිල්පින් සඳහා වන මාසික දීමනාව රු 7500/- බැගින් රු4,500,000/- මුදලක් වසර පුරාවට ලබා දීමට කටයුතු කර ඇත .

තවද ටවර් හෝල් රඟහල පදනම යටතේ පිහිටුවා ඇති 1996 වසරේ සිට ක්‍රියාත්මක කරන ප්‍රාසාංගික කලාකරුවන් සඳහා වන ජනාධිපති සුබසාධන අරමුදලින් රු 7500/- ක ජීවනාධාරය ලෙස රු .8,380,000/- ක් 2021 වසරේදි වැය කරන ලදී.මෙම සියලු මුදල් මෙම අරමුදල් දෙකට අයත් මුදල් රජයේ බැංකු වල ස්ථාවර තැම්පතු වල ආයෝජනය කර මාසිකව ලැබෙන පොළි මුදලින් හා ආයතනික ආදායම් වලින් ගෙවීමට හැකි විය.

මීට අමතරව වෛද්‍යාධාර,මරණාධාර, ලබා දීම් අක්ෂි සායන පැවැත්වීම් ඇස් කණ්නාඩි බෙදාදීම් කලාකරු වන්දනා වාරිකාව යන කලාකරු සුබසාධන කටයුතු රැසක් ක්‍රියාත්මක කිරීමට හැකි විය.

ටවර් හෝල් රඟහල පදනම මඟින් ක්‍රියාත්මක කරන ලද තවත් සුවිශේෂී කාර්යක් ලෙස කලාකරුවන් දිරි ගැන්වීම අරමුණු කර ගනිමින් ප්‍රේක්ෂා නාට්‍ය උළෙළ ක්‍රියාත්මක කිරීමටද කටයුතු කරන ලදී. 2021 වසර තුළ පැතිරි ගිය කොවිඩ් 19 වසංගතය හේතුවෙන් අකර්මණ්‍ය වී තිබූ වේදිකා නාට්‍ය කෂේත්‍රය උද්යෝගිමත් කිරීම අරමුණු කර ගනිමින් මෙම නාට්‍ය උළෙල සංවිධානය කරන ලදී.ඒ අනුව තෝරා ගත් නාට්‍ය 20 ක් ටවර් හා එල්පින්ස්ටන් රඟහල වල වේදිකා ගත කල අතර ඒ සඳහා ලැබුණු ටිකට් ආදායමෙන් මෙන්ම රාජ්‍ය හා පෞද්ගලික ආයතන වලින් ලැබුණු ප්‍රධානයන්ද ඇතුලුව රු ලක්ෂ 50 කට අධික මුදලක් කලාකරුවන්ගේ ආදායම් ලෙස උපයා දීමට ටවර් හෝල් රඟහල පදනමට හැකි විය.

තවත් සුවිශේෂී කාර්යයක් වන නාට්‍ය හා රංග කලාව උසස් ඩිප්ලෝමා පාඨමාලාව 2021 වසර තුළදි අඛණ්ඩව ක්‍රියාත්මක කල අතර රට වසා තැබූ දිනයන්හිදි මාර්ග ගත ක්‍රමයට දේශණ හා වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

තවද ප්‍රේක්ෂා හදිසි අනතුරු වෛද්‍ය රක්ෂණය නමින් රක්ෂණ යෝජනා ක්‍රමයක් 2021 වසර පුරාවට ක්‍රියාත්මක කරන ලදි.එහිදි ප්‍රාසාංගික කලාකරුවන් 500 දෙනෙකු රක්ෂණය කල අතර ඒ සඳහා රුපියල් මිලියන 10 ක මුදලක් රාජ්‍ය අමාත්‍යාංශය හරහා මහා භාණ්ඩාගාරයෙන් හිමි විය.ඒ යටතේ වසර පුරා ප්‍රාසාංගික කලාකරුවන්ට රුපියල් මිලියන 07 ක් වෛද්‍ය හා මරණාධාර වශයෙන් ප්‍රදානය කිරීමට හැකි විය.

කොවිඩ්-19 වසංගත තත්වය හමුවේ රංග ශාලා වලින් ලැබුණු ආදායම් සීමාවෙන් පහත වැටුණු අතර භාණ්ඩාගාර ප්‍රතිපාදන සියල්ල නොඅඩුව ටවර් හෝල් රහහල පදනම වෙත ලැබුණි. එම තත්වය යටතේ වුවද 2021 වසර තුල ටවර් හෝල් රහහල පදනම රු.5, 027,482/- ආදායමක් ඉපයීමට හැකි විය.

කාර්ය මණ්ඩලය සඳහා අලුතින් නිලධාරින් බඳවා ගැනීමට අවශ්‍යව පැවතුනද පැවති වසංගත තත්වය හේතුවෙන් එම කටයුතු සාර්ථක කර ගැනීමට නොහැකි විය. එසේ වුවද පුරප්පාඩුව පැවති අධ්‍යක්ෂ ජනරාල් තනතුර සැප්තැම්බර් මස 01 වන මස සිට සම්පූර්ණ කරන ලදි.

ටවර් හෝල් රහහල පදනමට 2021 වසරේදී ජාතික විගණන කාර්යාලයෙන් ලැබුණු විගණන විමසුම් සංඛ්‍යාව 02 ක් වන අතර ඒ සඳහා නියමිත කාලවාකවානුවලදී පිළිතුරු සැපයීමට හැකි විය. තවද අභ්‍යන්තර විගණන අංශයෙන් විමසුම් 02 ක් ලැබුණු අතර ඒ සඳහා ද ප්‍රමාණාත්මක පිළිතුරු ලබා දීම මෙන්ම එමගින් පෙන්වා දුන් බොහෝ අඩුපාඩු සහ මහහැරීම් රැසක් නිවරදි කර ගැනීමටද මෙම වසර තුළ හැකි විය.

ටවර් හෝල් රඟහල පදනම භාරකාර මණ්ඩලය - 2021

නිල බලයෙන් පත්වන සාමාජිකවරු

01 ටවර් හෝල් රඟහල පදනමේ සභාපති,
බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු ගරු අමාත්‍ය සහ
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු අග්‍රාමාත්‍ය
ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා

02 මුදල් ගරු අමාත්‍ය බැසිල් රාජපක්ෂ මැතිතුමා

03 රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන ගරු අමාත්‍ය
ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මැතිතුමා

04 ජාතික උරුම, ප්‍රාසාංගික කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු
ගරු රාජ්‍ය අමාත්‍ය විදුර වික්‍රමනායක මැතිතුමා

05 අග්‍රාමාත්‍ය ලේකම්, ගාමිණී සෙනරත් මහතා

06 බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්
මහාචාර්ය කපිල ගුණවර්ධන මහතා

07 අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් මහාචාර්ය කපිල සී. කේ. පෙරේරා මහතා

08 ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයෙ
ලේකම් කේ.ඒ.ඩී.ආර්. නිශාන්ති ජයසිංහ මහත්මිය

09 සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ තරණි අනෝජා ගමගේ මහත්මිය

10 කොළඹ මහ නගර සභාවේ ගරු නගරාධිපතිනී රෝසී සේනානායක මහත්මිය

11 කොළඹ මහ නගර සභාවේ නාගරික කොමසාරිස් නීතිඥ රෝෂිණී දිසානායක මහත්මිය

<u>ගරු අග්‍රාමාත්‍යතුමා විසින් පත්කරන සාමාජිකවරු</u>
<u>(පත්වීමේ දින සිට වසර 03 ක කාලයක් සඳහා)</u>

01 ජී.ආර්.පෙරේරා මහතා
02 චරිතා ප්‍රියදර්ශනී පීරිස් මහත්මිය
03 හෂීම් ඔමාර් මහතා

මහා භාණ්ඩාගාර නියෝජනය - කුලෝජා පීරිස් මෙනෙවිය, නියෝජ්‍ය අධ්‍යක්ෂ, සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව

- ජී.ඩී. ජිනදාස මහතා, අධ්‍යක්ෂ ජනරාල් (වැඩ බලන), ටවර් හෝල් රඟහල පදනම. 2021.03.03 - 2021.06.30
- කේ.ඒ.එච්.එච්. කිරිඇල්ල මහතා, අධ්‍යක්ෂ ජනරාල් (වැඩ බලන), ටවර් හෝල් රඟහල පදනම. 2021.07.12 – 2021.08.31
- ආචාර්ය ඩී.එම්.එස්. දිසානායක මහතා, අධ්‍යක්ෂ ජනරාල්, ටවර් හෝල් රඟහල පදනම. 2021.09.01 දින සිට

පාලන හා සංවර්ධන අංශය

- ටවර් හෝල් රඟහල පදනමේ සංවිධාන ව්‍යුහය -



ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරීන්

1. අධ්‍යක්ෂ ජනරාල්	-	නීතිඥ ඩග්ලස් සිරිවර්ධණ මහතා (2021.01.01.- 2021.02.28
	-	ජී.ඩි .ජීනදාස මහතා (2021.03.03 – 2021.06.30)
	-	කේ.ජී.එච්.එච්.කිරිඇල්ල මහතා (2021.07.12 – 2021.08.31
		ආචාර්ය ඩී.එම්.එස් දිසානායක මහතා (2021.09.01 සිට)
2. අධ්‍යක්ෂ (පාලන හා සංවර්ධන)	-	නිපුණ දිසානායක මහතා
3.අධ්‍යක්ෂ (නාට්‍ය ප්‍රවර්ධන අධ්‍යාපන හා වැඩසටහන්)වැ.බ	-	සම්පත් පෙරේරා මහතා
4. සහකාර අධ්‍යක්ෂ (මුදල්)වැ.බ	-	කේ.එච්.එම්.කේ දයානන්ද මිය
6. සහකාර අධ්‍යක්ෂ (නාට්‍ය ප්‍රවර්ධන, කලාකරු සුභසාධන හා වැඩසටහන්)	-	චන්දන බණ්ඩාර මහතා
7 සහකාර අධ්‍යක්ෂ (දෙමළ නාට්‍ය ප්‍රවර්ධන)	-	ආචාර්ය ෂම්මුග ෂර්මා ජයප්‍රකාශ් මහතා
8 පරිපාලන නිළධාරි	-	නයනි ලියනගේ මෙනවිය

අනුමත කාර්ය මණ්ඩලය හා සිටින කාර්ය මණ්ඩලය 2021.12.31 දිනට

සේවා ගණය	වැටුප් **කේත** අංකය		අංකය	තනතුරු	අනුමත සේවක සංඛ්‍යාව	සත්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සේවක සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම	HM-2-1		1	අධ්‍යක්ෂ ජනරාල්	1	1	0
	HM-1-1		2	අධ්‍යක්ෂ (පාලන හා සංවර්ධන)	1	1	0
			3	අධ්‍යක්ෂ (නාට්‍ය ප්‍රවර්ධන,අධ්‍යාපන භාවැඩසටහන්)	1	1	0
	MM-1-1		4	සහකාර /නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන හා සංවර්ධන)	1	0	1
			5	සහකාර /නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුද්‍රල්)	1	0	1
			6	සහකාර /නියෝජ්‍ය අධ්‍යක්ෂ (අධ්‍යාපන පර්යේෂණ හා සංරක්ෂණ)	1	0	1
			7	සහකාර /නියෝජ්‍ය අධ්‍යක්ෂ (නාට්‍ය ප්‍රවර්ධන කලාකරු සුභසාධන හා වැඩසටහන්)	1	1	0
			8	සහකාර /නියෝජ්‍ය අධ්‍යක්ෂ (දෙමළ නාට්‍ය ප්‍රවර්ධන)	1	1	0
කෘතීය මට්ටම	JM-1-1		9	පරිපාලන නිලධාරී	1	1	0
			10	කළමනාකරු (රහතල්)	3	3	0
			11	අභ්‍යන්තර විගණන නිලධාරී	1	1	0
	MA-4		12	සංවර්ධන සහකාර (අලෙවි)	1	1	0
			13	සංවර්ධන සහකාර (ගිණුම් හා මූල්‍ය)	1	1	0
			14	සම්බන්ධීකරණ නිලධාරී (පාඨමාලා)	1	1	0
			15	සම්බන්ධීකරණ නිලධාරී (වැඩසටහන් හා ප්‍රචාරණ)	1	1	0
			16	සම්බන්ධීකරණ නිලධාරී (සුභ සාධන)	1	1	0
			17	ජ්‍යෙෂ්ඨ ශබ්ද පරිපාලක	1	1	0
ද්විතීය මට්ටම	MA-2-1		18	වැඩ මූලික සිවිල්	1	0	1
			19	තාක්ෂණික සහකාර	1	0	1
			20	ශබ්ද පරිපාලක	1	0	1
			21	පොත් තබන්නා	1	1	0
	MA-1-1		22	කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන)	26	23	3
			23	කළමනාකරණ සහකාර (මුද්‍රල් අයකැමි)	1	1	0
			24	කළමනාකරණ සහකාර (දෙමළ භාෂිත)	1	1	0
ප්‍රාථමික මට්ටම	PL-3		25	රියැදුරු	6	4	2
			26	විදුලි කාර්මික ශිල්පී	1	1	0
			27	ශබ්ද ක්‍රියාකරු	4	1	3
			28	රංගාලෝක ශිල්පී	3	2	1
			29	නඩත්තුරු	1	0	1
	PL-2		30	රංගාලෝක ශිල්පී සහායක	3	0	3
	PL-1		31	කාර්යාල සහායක	7	4	3
			32	රංගශාලා සහායක	8	6	2
			33	පාලන මැදිරි සහායක	1	0	1
			34	රංග සේවා මැදිරි සහායක	1	1	0
			35	කෞතුකාගාර/ ලේඛනාගාර සහායක	1	1	0
			36	ශබ්ද ක්‍රියාකරු සහායක	3	3	0
			37	පොත් අලෙවිහල සහායක	1	1	0
				අනුමත එකතුව -	91	66	25

පුද්ගලික වන සේ ඇති තනතුරු - දැනට සේවයේ යෙදෙන

ද්විතියික මට්ටම ප්‍රථමික මට්ටම	MA 2-1	1	පරිගණක ක්‍රියාකරු	**1**	1	0
	PL 3	2	සම්බන්ධීකාරක (සංගීත)	**1**	1	0
	PL 2	3	කළමනාකාර සහායක	**2**	2	0
	මුළු එකතුව			**95**	**70**	***25***

2021 වර්ෂය

<u>කොන්ත්‍රාක් කාලය අවසන් වීම</u>

දිල්ශාන් ගයාන් මහතා - තාක්ෂණික සහකාර
(2021.08.14)

<u>ඉල්ලා අස්වීම්</u>

ඉන්දික පරණගමගේ මහතා - සහකාර අධ්‍යක්ෂ (මුදල්)
(2021.01.31)

ඉසුරු විජේවික්‍රම මහතා - වැඩමුලික (සිවිල්)
2021.01.08

<u>බඳවා ගැනීම්</u>

ආචාර්යඩී.එම්.එස් දිසානායක මහතා - අධ්‍යක්ෂ ජනරාල්
කේ.එච්.එම්.කේ දයානන්ද මිය - සහකාර අධ්‍යක්ෂ (මුදල්) වැ.බ)

2021 වර්ෂය

පුහුණු පාඨමාලා සඳහා සහභාගි වූ කාර්ය මණ්ඩලය

<u>පුහුණු හා පාඨමාලාවේ නම</u>	***<u>කාල සීමාව</u>***	***<u>සහභාගී වූ සංඛ්‍යාව</u>***
කළමණාකරණ පුහුණු වැඩසටහන	දින 01	සියළු කාර්ය මණ්ඩලය වෙනුවෙන්

<u>රංග ශාලා නවීකරණය සහ සංවර්ධනය</u>

සරසවිපාය

මරදාන එල්පින්ස්ටන් රහහලට යාබදව පිහිටා ඇති සරසවිපාය ගොඩනැගිල්ලේ වහලයේ ජල කාන්දුව වැලැක්වීම

සඳහා රු .7,640,800/- ක මුදලක් යටතේ ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදි.

ටවර් රහහල

ටවර් රහහලේ වහලය අලුත්වැඩියා කිරීම හා ජලකාන්දු වැලැක්වීම සඳහා රු. 5,000,000.00(ලක්ෂ 50)ක ඇස්තමේන්තුවක් යටතේ ව්‍යාපෘතියක් ආරම්භ කරන ලද අතර එය 2022 වසරේ නිමකිරීමට නියමිත වේ. බස්නාහිර පළාත් කර්මාන්ත සංවර්ධන අධිකාරිය මගින් මෙම කාර්යය ඉටු කරනු ලබයි.

ටවර් හෝල් රඟහල පදනම

රංග ශාලා සහ ශබ්දාගාරය වෙන්කිරීම් - 2021

මාසික වෙන් කිරීම් ආශ්‍රිත	මාසය.	වැඩසටහන												ශබ්දාගාරය
		ටවර් රඟහල				එල්ෆින්ස්ටන් රඟහල				රුක්මණිදේවී රඟහල				
		නාට්‍ය	ප්‍රසංග	නාට්‍ය පුහුණු	වෙනත්	නාට්‍ය	ප්‍රසංග	නාට්‍ය පුහුණු	වෙනත්	නාට්‍ය	ප්‍රසංග	නාට්‍ය පුහුණු	වෙනත්	පටිගත කිරීම්
	ජන	**1**	**1**	**-**	**-**	-	-	-	-	-	-	-	**4**	**6**
	පෙබ	**4**	**-**	**8**	**1**	-	-	1	-	-	**1**	-	**4**	**8**
	මාර්තු	**6**	**1**	**1**	**2**	1	1	-	-	-	**-**	-	**5**	**20**
	අප්‍රේල්	**-**	**-**	**-**	**-**	1	2	-	-	**-**	**-**	**-**	**4**	**18**
	මැයි	**-**	**-**	**-**	**-**	**-**	-	-	-	**-**	**-**	**-**	**-**	**2**
	ජුනි	**-**	**-**	**-**	**-**	**-**	-	1	-	**-**	**-**	**-**	**-**	**-**
	ජුලි	**7**	**-**	**-**	**-**	**-**	1	-	-	**-**	**-**	**-**	**3**	**3**
	අගෝ	**12**	**-**	**-**	**-**	**-**	-	-	-	**-**	**-**	**-**	**1**	**1**
	සැප්	**24**	**-**	**1**	**-**	**-**	-	3	-	**-**	**-**	**-**	**-**	**-**
	ඔක්	**1**	**-**	**1**	**-**	**-**	-	-	-		**-**	**-**	**1**	**7**
	නොවැ	**-**	**-**	**-**	**-**	**-**	1	1	-	**-**	**1**	**-**	**5**	**2**
	දෙසැ	**-**	**-**	**-**	**-**	7	3	**-**	-	**-**	**-**	**-**	**6**	4
එකතුව		**71**				**23**				**35**				**71**

නාට්‍ය ප්‍රවර්ධන කලාකරු
සුභසාධන සහ වැඩසටහන් අංශය

❖ <u>නාට්‍ය ප්‍රවර්ධන, කලාකරු සුභසාධන හා වැඩසටහන් අංශය</u>

- 2021.01.20 - ටවර් ශිල්පීන් 51 ක් හා ප්‍රාසාංගික කලාකරුවන් 97 දෙනෙකු සඳහා රු. 7500.00 බැගින් මාසික දීමනා ලබාදී ඇත.
- 2021.01.26 - ජනාධිපති සුභසාධක අරමුදලින් දීමනා ලැබූ එස්.ඩබ්.ජී. සේතුංග මහතාගේ අභාවය වෙනුවෙන් රු. 5000.00 ක මරණාධාර ලබාදෙන ලදී.
- ජනාධිපති සුභසාධක අරමුදලින් දීමනා ලබන ලතා වල්පොල මහත්මිය වෙත 2021 ජනවාරි සිට දෙසැම්බර් දක්වා රු. 3000.00 බැගින් වෛද්‍යාධාර ලබාදී ඇත.
- ටවර් හෝල් රහහල පදනම මගින් දීමනා ලබන සුදත් රවීන්ද්‍ර නීල් මහතා වෙත 2021 ජනවාරි සිට දෙසැම්බර් දක්වා රු. 2000.00 බැගින් වෛද්‍යාධාර ලබාදී ඇත.
- ටවර් හෝල් රහහල පදනම මගින් දීමනා ලබන ශීලා ද සිල්වා මහත්මිය වෙත 2021 ජනවාරි සිට දෙසැම්බර් දක්වා රු. 5000.00 බැගින් වෛද්‍යාධාර ලබාදී ඇත.
- 2021.02.19 - ටවර් ශිල්පීන් 51 ක් හා ප්‍රාසාංගික කලාකරුවන් 97 දෙනෙකු සඳහා රු. 7500.00 බැගින් මාසික දීමනා ලබාදී ඇත.
- 2021.02.22 - ජනාධිපති සුභ සාධක අරමුදලින් දීමනා ලැබූ යූ.පී. චන්දෝරිස් මහතාගේ අභාවය වෙනුවෙන් රු. 5000.00 ක මරණාධාර ලබාදෙන ලදී.
- 2021.03.16 - කලාකරුවන් 500 ක් වෙනුවෙන් රක්ෂණ ඔප්පු ප්‍රදානය කිරීමේ උත්සවය අරලියගහ මන්දිරයේ දී පැවැත්විණි.





- 2021.03.19 - ටවර් ශිල්පීන් 50 ක් හා ප්‍රාසාංගික කලාකරුවන් 96 දෙනෙකු සඳහා රු. 7500.00 බැගින් මාසික දීමනා ලබාදී ඇත.
- 2021.04.01 - ප්‍රේක්ෂා හදිසි අනතුරු හා වෛද්‍ය රක්ෂණාවරණය යටතේ කලා ශිල්පී මරියසේවියර් අඩිහල් මහතාගේ අභාවය වෙනුවෙන් රු.200,000.00 වටිනා චෙක්පත ඇයගේ භාරකරුවන් වෙත ප්‍රදානය කරන ලදී.



- 2021.04.09 - කලාකරුවන් 50 දෙනෙකු වෙත අලුත් අවුරුදු තිළිණ ප්‍රදානය කිරීමේ උත්සවය සවිසිරිපාය ශ්‍රවණාගාරයේ දී පවත්වන ලදී.





- 2021.04.09 - ටවර් ශිල්පීන් 50 ක් හා ප්‍රාසාංගික කලාකරුවන් 96 දෙනෙකු සඳහා රු. 7500.00 බැගින් මාසික දීමනා ලබාදී ඇත.

- 2021.05.20 - ටවර් ශිල්පීන් 50 ක් හා ප්‍රාසාංගික කලාකරුවන් 94 දෙනෙකු සඳහා රු. 7500.00 බැගින් මාසික දීමනා ලබාදී ඇත.

- 2021.05.28 - ප්‍රේක්ෂා හදිසි අනතුරු හා වෛද්‍ය රක්ෂණාවරණය යටතේ කලා ශිල්පී මයිකල් වින්ස්ටන් පීරිස් මහතාගේ අභාවය වෙනුවෙන් රු.200,00.00 වටිනා චෙක්පත ඔහුගේ භාරකරුවන් වෙත ප්‍රදානය කරන ලදී.



- 2021.06.18 - ටවර් ශිල්පීන් 50 ක් හා ප්‍රාසාංගික කලාකරුවන් 94 දෙනෙකු සඳහා රු. 7500.00 බැගින් මාසික දීමනා ලබාදී ඇත.
- 2021.07.20 - ටවර් ශිල්පීන් 50 ක් හා ප්‍රාසාංගික කලාකරුවන් 94 දෙනෙකු සඳහා රු. 7500.00 බැගින් මාසික දීමනා ලබාදී ඇත.
- 2021.07.31 - ප්‍රේක්ෂා හදිසි අනතුරු හා වෛද්‍ය රක්ෂණාවරණය යටතේ ප්‍රවීණ රංගන ශිල්පිනී හයිසින්ත් විජේරත්න මහත්මියගේ අභාවය වෙනුවෙන් රු.600,000.00 වටිනා චෙක්පත ඇයගේ භාරකරුවන් වෙත ප්‍රදානය කරන ලදී.





- 2021.08.09 - සමස්ත ලංකා සිංහල හා දෙමළ පාසල් නාට්‍ය තරගය - 2021 ට අදාළ චක්‍රලේඛය සකස් කර අනුමැතිය සඳහා ඉදිරිපත් කළ ද, එවකට පැවති කොවිඩ් -19 වසංගත තත්වය මත වැඩසටහන ක්‍රියාත්මක නොවුණි.
- 2021.08.20 - ටවර් ශිල්පීන් 50 ක් හා ප්‍රාසාංගික කලාකරුවන් 92 දෙනෙකු සඳහා රු. 7500.00 බැගින් මාසික දීමනා ලබාදී ඇත.
- 2021.08.30 - ප්‍රේක්ෂා හදිසි අනතුරු හා වෛද්‍ය රක්ෂණාවරණය යටතේ ඇස් කණ්ණාඩි වෙනුවෙන් මේ වන විට රු. 96,150.00 ක ප්‍රතිලාභ කලාකරුවන් වෙත ප්‍රදානය කර ඇත.
- 2021.09.17 - ටවර් ශිල්පීන් 50 ක් හා ප්‍රාසාංගික කලාකරුවන් 91 දෙනෙකු සඳහා රු. 7500.00 බැගින් මාසික දීමනා ලබාදී ඇත.
- 2021.10.04 - ස්වතන්ත්‍ර නාට්‍ය පිටපත් තරගය පැවැත්වීමට අදාළ ව්‍යාපෘති වාර්තාව අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී. කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් එම වැඩසටහන ක්‍රියාත්මක කර නොමැත.
- 2021.10.05 - ප්‍රේක්ෂා හදිසි අනතුරු හා වෛද්‍ය රක්ෂණාවරණය යටතේ බාහිර රෝගී ප්‍රතිකාර වෙනුවෙන් මේ වන විට රු. 320,428.12 ක ප්‍රතිලාභ කලාකරුවන් වෙත ප්‍රදානය කර ඇත.

- 2021.10.10 - ප්‍රේක්ෂා හදිසි අනතුරු හා වෛද්‍ය රක්ෂණාවරණය යටතේ රෝහල්ගත වීම් හා මරණාධාර වෙනුවෙන් මේ වන විට රු. 3,334,691.38 ක ප්‍රතිලාභ කලාකරුවන් වෙත ප්‍රදානය කර ඇත.

- 2021.10.18 - ටවර් ශිල්පීන් 49 ක් හා ප්‍රාසංගික කලාකරුවන් 90 දෙනෙකු සඳහා රු. 7500.00 බැගින් මාසික දීමනා ලබාදී ඇත.

- 2021.11.15 - මාර්ගගත නාට්‍ය පෝස්ටර් හා චිත්‍ර තරගය පැවැත්වීමට අදාළ ව්‍යාපෘති වාර්තාව අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී. ආයතනය තුල පැවති මූල්‍ය තත්වය මත මෙම වැඩසටහන ක්‍රියාත්මක කර නොමැත.

- 2021.11.19 - ටවර් ශිල්පීන් 49 ක් හා ප්‍රාසංගික කලාකරුවන් 89 දෙනෙකු සඳහා රු. 7500.00 බැගින් මාසික දීමනා ලබාදී ඇත.

- 2021.12.02 - ප්‍රේක්ෂා හදිසි අනතුරු හා වෛද්‍ය රක්ෂණාවරණය යටතේ ප්‍රවීණ රංගන ශිල්පී ආනන්ද කුමාරගේ මහතාගේ අභාවය වෙනුවෙන් රු.200,000.00 වටිනා චෙක්පත ඔහුගේ භාරකරු වන සරත් කුමාර මහතා වෙත ප්‍රදානය කරන ලදී.



- 2021.12.04 - ප්‍රේක්ෂා හදිසි අනතුරු හා වෛද්‍ය රක්ෂණාවරණය යටතේ ප්‍රවීණ නළු සම්පත් තෙන්නකෝන් මහතාගේ අභාවය වෙනුවෙන් රුපියල් ලක්ෂ 02 ක් වටිනා චෙක්පත එතුමාගේ බිරිඳ වන රත්නා ලාලනී ජයකොඩි මහත්මිය වෙත ප්‍රදානය කරන ලදී.



- 2021.12.11 සිට 2021.12.21 දින දක්වා ප්‍රේක්ෂා රංගකලා මහෝත්සවය මරදාන ටවර් හා එල්ෆින්ස්ටන් රංගශාලාවන්හි පැවැත්විණි. මෙම වැඩසටහන යටතේ දින 10 ක් තුල නාට්‍ය 20 ක්









- 2021.12.14 - ප්‍රේක්ෂා හදිසි අනතුරු හා වෛද්‍ය රක්ෂණාවරණය යටතේ ප්‍රවීණ රංගන ශිල්පී දමින්ද මහතාගේ අභාවය වෙනුවෙන් රුපියල් ලක්ෂ 02 ක් වටිනා චෙක්පත එතුමාගේ භාරකරු වන ශ්‍යාමලී අනෝජා මහත්මිය වෙත ප්‍රදානය කරන ලදී.



- 2021.12.15 - ප්‍රේක්ෂා හදිසි අනතුරු හා වෛද්‍ය රක්ෂණාවරණය යටතේ ප්‍රවීණ රංගන ශිල්පී ආනන්ද එස්. විජයසිරි මහතාගේ අභාවය වෙනුවෙන් රුපියල් ලක්ෂ 02 ක් වටිනා චෙක්පත එතුමාගේ බිරිඳ වන අයිරාංගනී ස්වර්ණලතා මහත්මිය වෙත ප්‍රදානය කරන ලදී.



- 2021.12.20 - ටවර් ශිල්පීන් 49 ක් හා ප්‍රාසංගික කලාකරුවන් 88 දෙනෙකු සඳහා රු. 7500.00 බැගින් මාසික දීමනා ලබාදී ඇත.
- 2021.12.31 - ප්‍රේක්ෂා හදිසි අනතුරු හා වෛද්‍ය රක්ෂණාවරණය යටතේ 2021 වර්ෂය අවසාන වන විට රු.මි. 7.5 කට අධික ප්‍රතිලාභ කලාකරුවන් වෙත ප්‍රදානය කර ඇත.

❖ අධ්‍යාපන, පර්යේෂණ හා සංරක්ෂණ අංශය

- 2021.03.27 - ලෝක නාට්‍ය දිනය වෙනුවෙන් බ්‍රිතාන්‍ය ජාතික වේදිකා, රූපවාහිනී හා සිනමා රංගනවේදිනියක වූ හෙලන් මිරේන් මහත්මිය විසින් ලෝක නාට්‍ය දින පණිවුඩය ඉදිරිපත් කර ඇත. එය සිංහල භාෂාවෙන් රත්නා ලාලනී ජයකොඩි මහත්මියත්, ඉංග්‍රීසි භාෂාවෙන් කෞෂල්‍ය ප්‍රනාන්දු මහත්මියත්, දෙමළ භාෂාවෙන් නෙරංජනී ශංමුගරාසා මහත්මිත් විසින් කියවන ලද හඬ පටය ටවර් හෝල් රහහල පදනම වෙබ් අඩවිය ඔස්සේ ප්‍රචාරය කරන ලද අතර, ලෝක නාට්‍ය දින පණිවුඩය නාට්‍යකරුවන් 1000 ක් වෙත තැපැල් කර යවන ලදී.

- 2021.08.21 - භාත්ඛණ්ඩ නැටුම්/ සංගීත විභාගය සඳහා අයදුම්පත් භාරගැනීම අවසන් කිරීමට නියමිතව තිබුණද, එම දිනය 2021.08.25 දක්වා දීර්ඝ කරන ලදී.

- 2021.09.30 - භාත්ඛණ්ඩ විභාගයට අදාළ බැංකු අණකරය ඉන්දියාවේ භාත්ඛණ්ඩ සංගීත් විද්‍යා පීඨය වෙත යවන ලදී.

නාට්‍ය හා රංගකලා පාසල

- 2021.01.04 සිට 2021.05.10 දින දක්වා අධ්‍යයන වර්ෂ 2019/20 සිසුන්ගේ ප්‍රථම අධ්‍යයන වාරයට අදාළ න්‍යායික දේශන මාර්ග ගත ක්‍රමය ඔස්සේ පවත්වන ලදී.

- 2021.04.21 - අධ්‍යයන වර්ෂ 2020/2021 සඳහා නවක සිසුන් බඳවා ගැනීමේ උත්සවය මරදාන එල්ෆින්ස්ටන් රහහලේ දී පවත්වන ලදී.





- 2021.04.22 සිට 26 දින දක්වා නවක සිසුන් 50 දෙනෙකු දිශානිමුඛ කිරීමේ වැඩසටහන මීගොඩ අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානයේ දී පවත්වන ලදී.

- 2021.04.27 සිට 2021.05.01 දක්වා අධ්‍යයන වර්ෂ 2020/21 සිසුන්ගේ පළමු අධ්‍යයන වාරයට අදාළ න්‍යායික කොටස්, වැඩමුළුවක් ආකාරයෙන් අවසන් කිරීමට අදාළ දේශන පවත්වන ලදී. මෙය මැයි මස 11 දින දක්වා පැවැත්වීමට කටයුතු සංවිධානය කර තිබූ නමුත්, කොවිඩ්-19 වසංගත තත්වය හේතුවෙන් මැයි මස 01 දිනෙන් අවසන් කිරීමට සිදුවිය.

- 2021.04.27 - නාට්‍ය හා රංගකලා පාසලේ අධ්‍යයන වර්ෂ 2021/22 සඳහා සිසුන් බඳවාගැනීමට අදාළ අයදුම් පත් කැඳවා අවසන් කිරීමට නියමිතව තිබුණද, 2021.05.28 දක්වා එම දිනය දීර්ඝ කරන ලදී.

- 2021.05.21 සිට 2021.12.03 දක්වා අධ්‍යයන වර්ෂ 2020/21 සිසුන්ගේ පළමු අධ්‍යයන වාරයට අදාළ න්‍යායික විෂය ආවරණය මාර්ග ගත ක්‍රමය ඔස්සේ පවත්වා අවසන් කරන ලදී.

- 2021.08.11, 12 සහ 13 දිනයන්හි අධ්‍යයන වර්ෂ 2018/19 සිසුන්ගේ අවසන් ප්‍රායෝගික පරීක්ෂණය මාර්ග ගත ක්‍රමය ඔස්සේ පවත්වන ලදී. මේ සඳහා සිසුන් 37 දෙනෙකු සහභාගී විය.

- කොවිඩ් 19 වසංගත තත්වය හා අ:පො:ස (සා:පෙළ) විභාග ප්‍රතිඵල නිකුත් කිරීම ප්‍රමාද වීම හේතුවෙන් නාට්‍ය පාසලේ අධ්‍යයන වර්ෂ 2021/22 සඳහා සිසුන් බඳවාගැනීමට අදාළව අයදුම්පත් කැඳවීම 2021.11.01 දින දක්වා දීර්ඝ කරන ලදී.

- 2021 වර්ෂයේ දී ටවර් නාට්‍ය හා රංගකලා පාසලේ අධ්‍යයන වර්ෂ 2017/18 සිසුන්ගේ අධ්‍යයන කාර්යයක් වශයෙන් "සිගනරැලේ ඔපෙරාව" නාට්‍ය නිෂ්පාදනය කරන ලදී.



❖ <u>දෙමළ නාට්‍ය ප්‍රවර්ධන අංශය</u>

- 2021.12.27 - දෙවර්ෂ පූර්ණ කාලීන නාට්‍ය හා රංගකලා උසස් ඩිප්ලෝමා පාඨමාලාව (දෙමළ) යාපනය සංදිලිප්පායි සංස්කෘතික මධ්‍යස්ථානයේ දී ආරම්භ කිරීමට අදාළ මූලික කටයුතු සංවිධානය කරන ලදී.

මූදල් අංශය



ටවර් හෝල් රඟහල පදනම

2021 වර්ෂය සඳහාවූ

විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } සිඒඒ/ඒ/ටීඑච්ටීඑල්/01/2021/27 මබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2023 ජනවාරි 31 දින

අධ්‍යක්ෂ ජනරාල්

ට්වර්හෝල් රහඟල පදනම

ට්වර්හෝල් රහඟල පදනමේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති

පිටපත් -: 1.ලේකම් - බුද්ධශාසන,ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

2. ලේකම් - මුදල් අමාත්‍යාංශය

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } සිඒඒ/ඒ/ටීඑච්ටීඑෆ්/01/2021/27 | ඔබේ අංකය / உமது இல. / Your No. } | දිනය / திகதி / Date } 2023 ජනවාරි 31 දින

අධ්‍යක්ෂ ජනරාල්
ටවර් හෝල් රඟහල පදනම

ටවර් හෝල් රඟහල පදනමේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ටවර් හෝල් රඟහල පදනමේ 2021දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, පදනමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූල නොවීම

(i) 2018 වර්ෂයේ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පරිත්‍යාග කර තිබූ කැබ් රථයක වටිනාකම 2019 ජනවාරි 01 දින ගිණුම්ගත කිරීමේදී ප්‍රමිත අංක 07 හි 25 හා 43 ඡේද ප්‍රකාරව වත්කම අත්පත් කරගත් දිනට පැවති සාධාරණ වටිනාකම වෙනුවට 2017 වර්ෂයේ රක්ෂණ කටයුතු සඳහා අගය කළ වටිනාකම වූ රු.4,000,000 පිරිවැය

ලෙස සලකා ගිණුම්ගත කර තිබුණි. 2020 වර්ෂයේදී එම වාහනාකම් සහ කැබ් රථය වෙනුවෙන් 2019 වර්ෂයේදී ප්‍රාග්ධනීත කරන ලද රු.443.800 ක වාහනාකම් වාහන වෙනුවෙන් 2019 වර්ෂයේදී ප්‍රාග්ධනීත කරන ලද රු.443.800 ක වාහනාකම් වාහන ගිණුමෙන් ඉවත් කර තිබුණු අතර මෙම වන්කම් අන්පත් කරගත් දිනට පැවති සාධාරණ වටිනාකම් වන්කමේ පිරිවැය ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වුවත්.රු.4,000.000 ක වටිනාකම සහ කැබ් රථය වෙනුවෙන් 2019 වර්ෂයේදී දරන ලද හා එම වන්කම් ගිණුමට ප්‍රාග්ධනීත කරන ලද රු.443,800 ක වටිනාකම වාහන ගිණුමට බැර කර 2020 වර්ෂයේදී මෙම වාහනය පොත් වලින් ඉවත් කිරීමට කටයුතු කර තිබුණි.ඒ අනුව මෙම කැබ් රථය 2020 වර්ෂයේ සිට.මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන දේපළ, පිරියත හා උපකරණ වලින් ඉවත්ව තිබුණි. මේ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල කිසිදු හෙළිදරව් කිරීමක්ද කර නොතිබුණි.

(ii) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 වන ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද නමුත් තවදුරටත් ප්‍රයෝජනයට ගනු ලබන පිරිවැය රු. 37,296,993 ක් වූ වාහන 09 ක ඵලදායී ජීවකාලය නැවත සමාලෝචනය කර ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(iii) සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද එහෙත් තවමත් භාවිතා කරන දේපල පිරියත හා උපකරණ වල ධාරණ අගය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 92 ඡේදය ප්‍රකාරව සටහන් මගින් හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි.

(iv) ටවර්හෝල් රහහල පදනම් සතුව පවතින රු.161,750,000 ක් පිරිවැය වූ ප්‍රධාන කාර්යාලීය ගොඩනැගිල්ල හා රු.1,250,000 ක් පිරිවැය වූ ශබ්දාගාරය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිත අංක 07 හි ක්ෂය සම්බන්ධ වගන්ති ප්‍රකාරව 2017 වර්ෂයේ සිට ක්ෂය කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ක්ෂය වියදම රු.16,300,000 ක් අඩුවෙන් හා සමුච්චිත ක්ෂය රු.81,506,962 ක් (2017–2021 කාලපරිච්ඡේදයට අදාල ක්ෂය) අඩුවෙන් දැක්වුණි.

(v) එල්ෆින්ස්ටන් රහහල නවීකරණය වෙනුවෙන් දරන ලද වියදම් ස්ථාවර වත්කමක් ලෙස 2019 වර්ෂයේ සිට හඳුනාගෙන තිබුණද නිවැරදිව ක්ෂය ගිණුම් ගතකර නොතිබීම හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට සමුච්චිත ක්ෂය ප්‍රමාණය රු. 9,557,988 ක් අඩුවෙන් දැක්වුණි.

(ආ) පාරිතෝෂික ගෙවීම් පරීක්ෂාව.

පශ්චාත් සේවක ප්‍රතිලාභ ලෙස පාරිතෝෂික ගෙවීම සඳහා 2021 දෙසැම්බර් 31 දිනට රු.23,343,775 ක් වෙන් කර තිබුණද ඊට අනුරූපී ස්ථාවර තැන්පතුවල ආයෝජන වටිනාකම රු.20,752,432 ක් වූයෙන් රු.2,591,343 ක ආයෝජන ඌනතාවයක් නිරීක්ෂණය විය.

(ඇ) එකතුව රු.1,069,650 ක් වූ ණයගැති ශේෂ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවෙන් හා රු.20,735 ක් සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයෙන් ලැබිය යුතු ලෙස මූල්‍ය වාර්තාවල දක්වා තිබුණද එම ආයතනවල එවැනි ගෙවිය යුතු ශේෂ නොපවතින බව එම ආයතන විසින් තහවුරු කර තිබුණි.

(ඇ) 2021 මූල්‍ය වාර්තා වල සංචිත යටතේ ප්‍රසාංගික කලාකරුවන් සඳහා වූ ජනාධිපති සුභසාධන අරමුදල නමින් රු.60,399,700 ක අරමුදල් ශේෂයක් දක්වා තිබුණද අදාල සුභ සාධක අරමුදල නමින් වූ ස්ථාවර තැන්පතු එකතුව රු.70,999,700 ක් විය.ඒ අනුව අරමුදලේ ශේෂය රු.10,600,000 ක් අඩුවෙන් දැක්වුණි.

(ඉ) 2021 වර්ෂය සඳහා විලම්භිත අයභාරය ලෙස රු.46,930,196 ක මුදලක් රජයේ ප්‍රාග්ධන ලැබීම් සංචිතයෙන් අයකර පොදු සංචිතයට බැර කර තිබුණද විලම්භිත අයභාරය හඳුනාගැනීමේ පදනම ගිණුම් සටහන් මගින් හෙළිදරව් කර නොතිබුණි.

(ඊ) සරසවිතාය ගොඩනැගිල්ල සඳහා වාර්ෂික ක්ෂය රු.26,043,008 ක් වුවද,ඒ සඳහා රු.43,071,923 ක් විලම්භිත අයභාරය ලෙස හඳුනාගෙන තිබුණි.

(උ) වසර ගණනාවක් තිස්සේ ගිණුම්වලින් ඉදිරියට ගෙන එන එකතුව රු.79,368,600 ක් වූ ශේෂයන් පිළිබඳ තොරතුරු/ ලිපිගොනු/ ලේඛන විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එම ශේෂයන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම. මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 පදනමේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී, සදහන් අවශ්‍යතා පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සදහා ඇවැර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අවශ්‍ය පැවැත්මේ සදහන් මත ගිණුම් නැවීම් හා සදහනේ අවශ්‍ය පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සදහනේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් වසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සදහනේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවන පරිදි ස්වකීය අදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම්

සම්පූර්ණයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමෙදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයෙහි පනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි තනි හෝ සාමූහික ලෙස බලපෑමේ තිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රදා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය පැකිලිකූල් බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූලික ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම් හා තක්සේරු කිරීම් සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිශාධ සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වංචා හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන හානියට වඩා වංචාවකින් සිදුවිනොහැ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයන්, වංචාව වළක්වන සැලසිමවල්, මවිතහාත්මික ඉවතැරීම්වලින්, වැරදිවලින් මෙන් අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් පදනමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් ඇතිවන බලපෑම් හැර නිසි මූල්‍ය වාර්තා පදනම පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පදනමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ මතය සඳහා පදනම කොටසේ 1.2 (අ) (i),(ii), (iv), (v), (ඇ), සහ (උ) හි දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල. පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පදනමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට පදනම සම්බන්ධ යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ පදනම පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීති,රීති/ විධානයට යොමුව	විස්තරය
(අ) 1978 අංක 1 දරන වවර්ගෝල් රහහල පදනම පනතේ 8 වෙනි වගන්තිය හා පදනම සතු සවසිරිපාය ගොඩනැගිල්ල සහ එය පිහිටි භූමිභාගය පදනම වෙත පවරාදීමට අදාල 1980 ඔක්තෝබර් 08 දිනැති විශේෂ දීමනා පත්‍රයේ නියමයන්	1. මෙම ඉඩම හා එහි පිහිටි ගොඩනැගිලි ජාතික නෘත්‍ය කටයුතු දිරිගැන්වීම සහ ප්‍රවර්ධනය කිරීමට අවශ්‍ය කාර්යන් සඳහා මිස වෙනත් කාර්යයන් සඳහා නොයෙදවිය යුතු බවත් එම කාර්යයන් සඳහා නොයෙදවන ලද්දේ නම් එවිට එය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට පෙරලා පැවරෙනු ඇති බවත් සඳහන් වී තිබුණද පදනම සතු සවසිරිපාය ගොඩනැගිල්ල හා එය පිහිටි භූමිභාගය ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියට අවස්ථා 02 කදී වසර 30 බැගින් බදු දී තිබුණි. 2. ඉහත බදු ගිවිසුම 2016 මැයි 14 දින අවසන් වී තිබූ අතර එම අධිකාරිය දිගින් දිගටම ගොඩනැගිල්ලේ රැඳී සිටියද 2016 මැයි 15 සිට 2022 දෙසැම්බර් 31 දක්වා කිසිදු බදු කුලියක් පදනම වෙත අය වී නොතිබුණි. 3. රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ 2022 පෙබරවාරි මස 14 දිනැති කුලී තක්සේරු වාර්තාව ප්‍රකාරව 2016 මැයි 14 දින සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා මාසයකට රු.3,490,000 බැගින් වූ කුලී වටිනාකමක් අධිකාරිය වෙතින් අයකරගත යුතු වුවද, එසේ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. 4. 2019 මාර්තු 06 දින පදනම විසින් විධිමත් අනුමැතියකින් හා විධිමත් පත්වීමක් නොලද අධ්‍යක්ෂ ජනරාල්වරයකු අත්සන් තබන ලද ලිඛිත බදු ගිවිසුමක් මගින් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියට නැවත වසර 30 ක කාලයක් සඳහා ලබාදී තිබුණි. පළමු බදු ගිවිසුම අවසන් වී වසර 06 කට වඩා වැඩි කාලයක් ගතවී තිබුණද නීත්‍යානුකූල නොවන දෙවන බදු ගිවිසුමෙහි ලියාපදිංචිය අවලංගු කරවා ගැනීමට හා කිසිදු කුලී මුදලක් නොගෙවා නීත්‍යානුකූල නොවන අයුරින් පදනම් පරිශ්‍රයේ රැඳී සිටින කර්මාන්ත

සංවර්ධන අධිකාරිය සඳහන් පරිශ්‍රයෙන් ඉවත් කිරීමේ නිර්මාණ මියවර ගෙන නොතිබුණි.

(ආ)	1997 අංක 11 දරන රථවාහන හෝල් රහතල පදනම් (සංශෝධන) පනතේ 6 වන වගන්තිය	පදනමේ පරමාර්ථයන්ට පටහැනිව රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරිත්වය යටතේ සරසවිපාය පැරණි ගොඩනැගිල්ල ඉඩත් කර මහල් 08 කින් යුත් බහුකාර්ය වාහිජ ගොඩනැගිල්ලක් හා මිහලිව් රුක්මණිදේවි රහතල පිහිටි ඉඩමේ මහල් කිහිපයකින් යුත් බහුකාර්ය ගොඩනැගිල්ලක් ඉදිකිරීම් සඳහා භාරකාර මණ්ඩලයේ අනුමැතිය ලබාදී තිබුණි.
(ඇ)	2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 20(1) හා 102 වගන්ති	පදනම් 2018/2019 හා 2019/2020 නිකුත්කරු වර්ෂ සඳහා ආදායම් බදු ගෙවීම්වල කටයුතු කර නොතිබුණු අතර ආදායම් බදු සඳහා ලියාපදිංචි වීමට හෝ බදු නිදහස් කර ගැනීමටද කටයුතු කර නොතිබුණි.
(ඈ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ VIII වැනි පරිච්ඡේදයේ 6.1 ඡේදය	පදනමේ සේවිකයන්ගේ පැයක අතිකාල අනුපාතය සැය 1ට සැය 1½ ක් ලෙස නිර්ණය කර එම අනුපාතය මත 2018 අප්‍රේල් 11 දිනැති අංක 02/2016(ii) දරණ කළමනාකරණ සේවා වක්‍රලේඛයේ 02(i)(ඇ) ඡේදයට පටහැනිව 2016 ජනවාරි 01 දින සිට 2018 අප්‍රේල් 11 දක්වා හිඟ අතිකාල ලෙස රු.1,438,435ක් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය මත සේවිකයින් 51 දෙනෙකුට 2019 මාර්තු 08 දින ගෙවා තිබුණි. මෙම හිඟ අතිකාල ගෙවීම් සඳහා 2019 මාර්තු 15 දින භාරකාර මණ්ඩලයේ කාවරණ අනුමැතිය ලබා දී තිබුණද කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් ගෙවූ හිඟ අතිකාල අනුමත කිරීම ප්‍රතික්ෂේප කර තිබුණි.
(ඉ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූල්‍ය රෙගුලාසි සංග්‍රහය	
	(i) මූල්‍ය රෙගුලාසි 119(1), 119(2) සහ 233	1. අනුමැතියකින් තොරව සේවිකයින් 51 දෙනෙකුට 2019 මාර්තු 08 දින ගෙවන ලද අතිකාල රු.1,438,435 නීතියානුකූල නොවන ගෙවීමක් හෙයින් එකඑර් හපසු යෙකර ගත යුතු වුවත් 2020 ඔක්තෝබර් දක්වා කිසිදු කාර්ය විශයෙන් අයකර ගැනීමට කටයුතු කර නිබුණි.
		2. අපසු අයකර ගන්නා වාරික ගණන 12 ඉක්මවන පරිදි අයකර ගැනීමට නියම දිය හැකි වන්නේ අමාත්‍යංශ ලේකම්වරයාට වුවද, අනුමැතියෙන් තොරව ගෙවන ලද අතිකාල වාරික 48 ක් දක්වා අයකර ගැනීමේ අධ්‍යක්ෂ ජනරාල්වරයා බලයාදී තිබුණු අතර 2021 දෙසැම්බර් 31 වන විට සේවිකයන් 21 දෙනෙකුගෙන් අයවිය යුතු රු.612,345 ක මුදලක් නිල්ලවන් අයවිය යුතුව පැවතුණි.
	(ii) මූල්‍ය රෙගුලාසි 454	2021 වර්ෂයේ මිලදී ගත් මුදල් යතුරු 06 ක් සහ ලැප්ටොප් පරිගණක 09 ක් කොන්ත්‍රාත්කරු වෙත භාර දී ඇතත් කර නොතිබුණි.

(iii)	මුදල් රෙගුලාසි 751	භාණ්ඩ සමීක්ෂණවලදී පොත් වල සටහන් කර නොමැති බව අනාවරණය වූ සහ පොත් වලට ගත යුතු බවට නිර්දේශ කර තිබූ භාණ්ඩ පොත් වලට ගෙන නොතිබුණි.
(iv)	මුදල් රෙගුලාසි 754	බඩු ලේඛන පොත්වල ඇතුලත් ඇතැම් අයිතම වසර ගණනාවක සිට තුලනය කර ශේෂ ඉදිරියට ගෙනවිත් නොතිබුණි.
(v)	මුදල් රෙගුලාසි 772(3)	2010 වර්ෂයෙන් පසු වෙන්දේසි කළ හෝ විනාශ කළ භාණ්ඩ ඒ ඒ අවස්ථාවල පොත් වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.
(vi)	මුදල් රෙගුලාසි 804	අංශ අතර මාරු කරන ලද භාණ්ඩ විධිමත් පරිදි නිකුත් කිරීම් හා ලැබීම් ලෙස බඩු ලේඛන පොත්වලට ඇතුළත් කර නොතිබුණි.
(vii)	මුදල් රෙගුලාසි 880 සිට 893 දක්වා සහ 612 වැනි අධිකාරිය මත වූ රජයේ නිලධාරීන්ගේ ඇප ආඥාපනත	ඇප තැබිය යුතු නිලධාරීන් හඳුනාගෙන ඇප ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී-12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය

(i)	4.2.6 වගන්තිය	2021 කාර්තුමය, අර්ධ වාර්ෂික හා වාර්ෂික කාර්යසාධන වාර්තා භාරකාර මණ්ඩලය වෙත ඉදිරිපත් කර නොතිබුණි.
(ii)	5.1.3 හා 5.2.1 වගන්ති	2021 අයවැය වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණේ 2022 ජූලි 28 දිනදී වන අතර අයවැය ලේඛනය සමග අයවැයගත විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, අයවැයගත මූල්‍ය තත්ත්ව ප්‍රකාශය හා අයවැයගත මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කර නොතිබුණි.
(iii)	6.5.3 වගන්තිය	2020 වර්ෂයේ වාර්ෂික වාර්තාව මෙම වාර්තාවේ දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.
(iv)	7.3 වගන්තිය	භාරකාර මණ්ඩලයේ අනුමැතිය මත 1997 සිට ක්‍රියාත්මක කර තිබුණු පදනමේ අත්පොත සඳහා රේඛීය අමාත්‍යාංශයේ අනුමැතිය හා භාණ්ඩාගාර එකඟතාවය ලබාගෙන නොතිබුණි.

(උ)	2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 වගන්තිය	2021 වර්ෂයේ අයවැය වාර්තාව, ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වෙත 2021 ජූනි 28 දින ඉදිරිපත් කර තිබුණු අතර අභ්‍යන්තර විගණන සැලසුම හා වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක්මුදල් අවශ්‍යතා සැලසුම ඉදිරිපත් කර

නොතිබුණි.

(උ) 2020 අගෝස්තු 28 දිනැති 01/2020 දරන රාජය මුදල් වක්‍රලේඛය

(i) 11.04 වගන්තිය — භාණ්ඩ සමීක්ෂණ වාර්තා වලින් නිරීක්ෂණය වූ ඌනතා හා අතිරික්තතා වාර්තා කිරීම හා ක්‍රියාමාර්ග ගැනීම ඉදිරි මුදල් වර්ෂයේ පෙබරවාරි 28 දිනට පෙර සිදු කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) 11.05 වගන්තිය — භාණ්ඩ සමීක්ෂණ වලදී හොඳ 47 මිනින් වාර්තා කරන ලද භාණ්ඩ සම්බන්ධයෙන් කටයුතු කිරීම ඉදිරි මුදල් වර්ෂයේ මාර්තු 15 ට පෙර සිදු කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඩ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය

(i) මාර්ගෝපදේශ අංක 2.7 — ආරක්ෂක සේවා ලබා ගැනීමේදී සහ ප්‍රේක්ෂා හදිසි අනතුරු හා වෛද්‍ය රක්ෂණාවරණය සඳහා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවක් පත් කර ගත යුතු වුවද ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවක් පත් කරගෙන තිබුණි.

(ii) මාර්ගෝපදේශ අංක 3.2.2 — නරඹකාරී ලංසු කැඳවීමකින් තොරව අවස්ථා 09 කදී දින දිර්ඝ කරවා දෙමින් මාස 22 ක කාලයක් සඳහා ආරක්ෂක සේවා ලබා ගෙන තිබුණි.

(iii) මාර්ගෝපදේශ අංක 4.2.2 — ආරක්ෂක සේවාව සපයාගැනීමේ කාර්යය සඳහා ප්‍රසම්පාදන කාල සටහනක් සකස් කර නොතිබුණි.

(iv) මාර්ගෝපදේශ අංක 6.3.3 (අ) — ප්‍රසම්පාදන කමිටුව විසින් ලංසු විවෘත කිරීමේ අධිකාරිය, ලංසු විවෘත කිරීමේ කමිටු සාමාජිකයින් වෙත නිසි පරිදි පවරා නොතිබුණි.

(v) මාර්ගෝපදේශ අංක 6.3.6 — ආකෘති ප්‍රකාරව ලංසු විවෘත කිරීම් සිදුකිරීම් වාර්තා සටහන් කිරීම් හා රැස්වීම් සඳහා සහභාගිවූවන් සිදුකිරීම් අත්සන් පරීක්ෂාවෙන් තොර් නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සැනසීම් ඵලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් වෙගයකාරිය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර සැනසීමේ සමහන් සකසුරුවම් ලෙස. කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සැලැස්ම වලට අනුකූලව ප්‍රසම්පාදනය කර ගැනීමට කටයුතු කර නොමැති බව.

(අ) වවුල් හෝල් ගගහල සැනසීම් විසින් වවුරි රහගල, වළහිත්ඝරිය රහගල හා රැක්ෂණි වැව් රහගල යන රහගල් වෙත ආරක්ෂක සේවා ලබා ගැනීම් සඳහා එනා-අග ආරක්ෂක සේවා සමාගම නම් ආයතනය සමග 2019 මාර්තු 11 දින සිට 2020 මාර්තු 10 දින දක්වා වූ එක් වසරක් කාලසීමාවකට ලිඛිත ගිවිසුමකට එළඹ තිබුණ අතර සඳහන් සමග සැපයිය යුතු ආරක්ෂක සේවක සංඛ්‍යාව සපයා නොගිනියේ 2020

මෙහෙයවරු 17 දින සිට 2022 පෙබරවාරි 11 දින දක්වා අවස්ථා 10 කදී දින දිවා කාර්යාල වේලාව තුළ ලබා ගෙන තිබුණි. ඒ අනුව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව වාර්ෂික සෙවා සඳහා ප්‍රසම්පාදන කටයුතු කිරීමට පදනම් කටයුතු කර නොතිබුණි.

(ආ) නාක්ෂණ ඇගයීම් කමිටුව විසින් ලංසු මල්ලවන ඇගයීමට ලක්කර ලබා ඕල ගණන් ඉදිරිපත් කරන ලද ආයතන 02 ක වැටුප්. පඩිපාලක සභාවේ ඕල ගණනට වඩා අඩු ලගයක පැවතියි හා රජයේ ආයතන 2 ක සේවා සපයන බවට තොරතුරු ඉදිරිපත් කර නොතිබීම හේතුවෙන් ඇගයීම් කටයුතු වලින් ඉවත්කර තිබුණු අතර තෙවැනි වරම් ලංසුව ඉදිරිපත් කරන ලද යුනි ලංකා සිකියුරිටි සර්විසස් (පුද්) සමාගම තෝරා ගත්කරගෙන තිබූ අතර 2021 අගෝස්තු 18 දින ප්‍රාදේශිය ප්‍රසම්පාදන කමිටුව විසින් නාක්ෂණ ඇගයීම් කමිටුවේ මෙම නිරණයට එකඟනාවය දන්වා තිබුණි.

(ඇ) තෝරාගත් ආයතනයට ලංසු ඕරිහමා ගිවිසුම් අත්සන් කිරීමට පැමිණෙන ලෙස දන්වා එකී ආයතනය එය පිළිගෙන කාර්යසාධන සුරක්ෂණයක්ද මුදලින් තැන්පත් කර තිබුණද එම ආයතනය සමග ලිඛිත ගිවිසුමකට එළඹීමකින් තොරව පැවති සාරක්ෂක සේවා සමාගමේ කාලය දීර්ඝ කර තිබුණි.

(ඈ) 2021/2022 වර්ෂයේ ප්‍රසම්පාදන කාර්ය නිම කිරීමේ වියරකට ආසන්න කාලයක් ගත කර තිබුනද,අවසානයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අවභැතිව පඩි පාලක සභා අඟ පහතින් විසි විධානයන්ට අවභැතිව කටයුතු කරන පැවති සමාගමටම කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුනද එම සමාගම් සමග ලිඛිත ගිවිසුමකට එළඹීමටද පදනම් කටයුතු කර නොතිබුණි.

2.3 වෙනත් කරුණු

(අ) 1978 අංක 01 දරන ටවර් හෝල් රහතල පදහම් පනත කාලානුරූපීව සංශෝධනය කර ගැනීමට කියවර ගෙන නොතිබුණි.

(ආ) අධ්‍යක්ෂ ජනරාල්ගේ 2019 මාර්තු 15 දිනැති අංක 2019/294/03/01 දරන පාලක මණ්ඩල පත්තිකාව මගින් රු.3.000 ක් ව පැවති ටවර් හෝල් ශිල්පීන් ඇගයීමේ සහ ජනාධිපති සුභ සාධන අරමුදල් 02 මගින් ගෙවනු ලබන විශ්‍රාම වැටුප් දීමනාව රු.7.500 දක්වා වැඩි කිරීමට යෝජනා කර තිබූ නමුත් අවශ්‍ය වන අතිරේක මුදල් ප්‍රමාණය පහසා ගැනීම සඳහා නව උපාය මාර්ගයකින් යුතු හෝ නැති බව් දන්වා තිබුණද නව උපාය මාර්ග හඳුනාගැනීමකින් තොරව පාලක මණ්ඩලය විසින් එම පත්තිකාව අනුමත කර 2019 අප්‍රේල් සිට මේ දක්වා රු.7.500 බැගින් විශ්‍රාම වැටුප් ගෙවා තිබුණි.එසේ වුවද සමාලෝචන වර්ෂයේදී ද එවැනි නව උපායමාර්ගයක් හඳුනාගැනීමෙන් තොරව රහතලේ අරමුදල් භාවිතා කර විශ්‍රාම වැටුප් දීමනා ගෙවා තිබුණි.

(ඇ) ආර්ථික විගණන පනතේ 40(1) වගන්තිය අනුව අමාත්‍යාංශයක් යටතේ ඇති විගණනය කරනු ලබන ආයතනයන් හි මහාචාර්ය විගණනය සිදු කිරීම සඳහා එම ආයතනයේ පාලක මණ්ඩලය විසින් යටා සභිදි පත්කරනු ලබන නඩාගේම් මහාචාර්ය විගණකවරයකු සිටිය යුතුය.එසේ වුවද පදනම් අනුව කාර්ය මණ්ඩලයේ මහාචාර්ය විගණන නිලධාරියකු පවත්නේ නැතැයි කර ඇති නමා මහාචාර්ය විගණක තනතුරක් අනුමත කාර්ය මණ්ඩලයේ

ඇතුලත් කර ගැනීමට හා අභ්‍යන්තර විගණකවරයකු පත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ජාතික විගණන පනතේ 38 (ඊ) වගන්තිය අනුව අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට සහතික වීම ගණන් දීමේ නිලධාරියෙකුගේ වගකීමක් වේ.ඒ අනුව අභ්‍යන්තර විගණකවරයකු පත්කර නිසිපරිදි අභ්‍යන්තර විගණනය සිදු කිරීමට අවශ්‍ය පහසුකම් හා පරිසරය ගණන් දීමේ නිලධාරී විසින් ඇති කළ යුතු වේ.එසේ වුවද පදනමේ අභ්‍යන්තර විගණන කටයුතු සඳහා ප්‍රමාණවත් විගණන කාර්ය මණ්ඩලයක් පත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) අභ්‍යන්තර විගණන සැලැස්ම අනුව අංශයේ මුළු මිනිස් පැය ගණන වූ මිනිස් පැය 3184න් සියයට 66 ක් එනම් මිනිස් පැය 2110 ක් වැය කර මූල්‍ය අංශය, වැටුප් සහ සේවක මණ්ඩල කළමනාකරණය යන ක්ෂේත්‍ර යටතේ විගණන ක්‍රියාකාරකම් 18 ක් සහ විශේෂ වී ගණනයන් 03 ක් සිදු කිරීමට සැලසුම් කර තිබුනද වර්ෂය තුල අභ්‍යන්තර විගණන වාර්තා 02 ක් පමණක් ඉදිරිපත් කර තිබුණු අතර ඉන් එක් වාර්තාවක් විගණන සැලැස්මෙහි අන්තර්ගත නොවූ රුක්මණී දේවී අනුස්මරණ මධ්‍යස්ථානය සහ කෞතුකාගාරය සම්බන්ධයෙන් විය.

(ඊ) ඉදිරිපත් කරන ලද කාර්ය සාධනය ඇතුලත් වාර්තාව ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව පිළියෙල කර නොතිබුණි. එහි එක්-එක් ක්‍රියාකාරකමට අදාල භෞතික ඉලක්ක හා භෞතික ළඟාවීම් ඇතුලත් කර නොතිබුණු අතර භෞතික ප්‍රගතිය ප්‍රතිශතයන් වශයෙන් පමණක් ඇතුලත් කර තිබීමේ හේතුවෙන් එක් එක් ක්‍රියාකාරකම් තුලින් අරමුණු වලට කොතෙක් දුරට ළඟා වී ඇත්ද යන්න විගණනයේදී පරීක්ෂා කිරීමට නොහැකි විය.

(උ) 2021 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද ක්‍රියාකාරී සැලැස්මට අනුව වැඩ සටහන්/ව්‍යාපෘති 35 ක් වෙනුවෙන් රු.මි.58ක් වෙන් කර තිබුනද ඉන් 21 ක් සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කර නොතිබූ අතර ඒ සඳහා වෙන්කර තිබූ මුදල රු.මි.13.478 ක් විය.

(ඌ) 2021 ක්‍රියාකාරී සැලැස්මට අනුව කාර්ය සාධන දර්ශකය හා ප්‍රතිදානය දක්වා තිබුනද ඉදිරිපත් කර තිබූ ප්‍රගති වාර්තාව අනුව අපේක්ෂිත කාර්ය සාධන දර්ශකය හා ප්‍රතිදානය කොතෙක්ද යන්න දක්වා නොතිබූ අතර ව්‍යාපෘතිය හෝ වැඩසටහන 100% කින් නිමකර තිබුනද අපේක්ෂිත කාර්ය සධනය ළඟා කරගෙන ඇති බවට විගණයට තහවුරු කර ගැනීමට නොහැකි විය.

(එ) 2021 දෙසැම්බර් 31 දිනට තනතුරු 16 කට අදාලව පුරප්පාඩු 26 ක් පැවති අතර ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 03 ක් තෘතීය මට්ටමේ තනතුරක් ද්විතීය මට්ටමේ තනතුරු 06 ක් සහ ප්‍රාථමික මට්ටමේ තනතුරු 16 ක් ඒ අතර විය.

ඩබ්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති

ටවර් හෝල් රඟහල පදනම

2021 වර්ෂය සඳහාවූ මුල්‍ය ප්‍රකාශය

ටවර් හෝල් රඟහල පදනම
2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	2021 රුපියල්	2020 රුපියල්
වත්කම්			
ජංගම වත්කම්			
අතැති මුදල් සහ බැංකු ශේෂය	6	1,397,386	11,008,636
ඉන්වෙන්ටරි	9	2,715,953	2,516,796
තැන්පතු	7	158,000	158,000
පෙරගෙවුම්	7	427,006	2,320,886
වසරක් ඇතුළත ලැබිය හැකි ආපදා ණය	7	2,633,047	2,745,048
අත්තිකාරම්	7	8,213,892	4,849,694
ණය ගැනියන්	8	2,455,957	2,548,357
වෙනත් ලැබිය යුතු දේ	8	679,792	2,073,221
ආයෝජන - THT සහ TRT	10	124,568,211	124,568,211
ආයෝජන - PWF	10	70,999,700	70,999,700
මුළු ජංගම වත්කම්		**214,248,944**	**223,788,548**
ජංගම නොවන වත්කම්			
දේපල, පිරියත සහ උපකරණ	11	1,550,262,090	1,618,062,659
කෙරෙමින් පවතින වැඩ - RDMC		274,303	274,303
කෙරෙමින් පවතින වැඩ - "සරසවිපාය" ප්‍රතිසංස්කරණය		4,736,893	4,736,893
කෙරෙමින් පවතින වැඩ - "ටවර් හෝල්" ප්‍රතිසංස්කරණය		-	-
වසරකට පසු ලැබිය යුතු ආපදා ණය	7	6,694,250	9,757,297
